සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 | S | I, II**

43254

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

| | |
|---|---|
| **කෘෂි හා ආහාර තාක්ෂණය** | **I, II** |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | **I, II** |
| Agriculture and Food Technology | **I, II** |

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කෘෂි හා ආහාර තාක්ෂණය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** විදේශ ආක්‍රමණ නිසා දේශීය කෘෂිකර්මාන්තයට සිදු වූ බලපෑමක් වන්නේ,
(1) වැව් පද්ධතිය ප්‍රතිසංස්කරණය සහ වාරි තාක්ෂණය දියුණුවීමයි.
(2) වැවිලි බෝග මත පදනම් වූ වාණිජ කෘෂි ආර්ථිකයක් බිහිවීමයි.
(3) ගොවි ජනපද හා විවිධ බහු කාර්ය යෝජනා ක්‍රම ඇතිවීමයි.
(4) වී ඇතුළු දේශීය ආහාර නිෂ්පාදනය වැඩිවීමයි.

**2.** ශ්‍රී ලංකාවේ මහ කන්නයට ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන්නේ,
(1) නිරිත දිග මෝසම් වැසි මගිනි.
(2) ඊසාන දිග මෝසම් වැසි මගිනි.
(3) පළමුවන අන්තර් මෝසම් වැසි මගිනි.
(4) දෙවන අන්තර් මෝසම් වැසි මගිනි.

**3.** වැඩි ආලෝක තීව්‍රතාවක් ප්‍රිය කරන බෝග පමණක් ඇති වරණය තෝරන්න.
(1) වී හා කෝපි
(2) කොකෝවා හා කෝපි
(3) මිරිස් හා වම්බටු
(4) මිරිස් හා ගම්මිරිස්

**4.** වායුගෝලයේ සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වන විට,
(1) ශාක රෝග ආසාදන අඩු වේ.
(2) ජලය හා පෝෂක අවශෝෂණය වැඩි වේ.
(3) සුළඟ මගින් පරාග විසිරීම පහසු වේ.
(4) දඬු කැබලිවල මුල් හට ගැනීම හොඳින් සිදු වේ.

**5.** පහත සඳහන් පාෂාණ අතුරෙන් ආග්නේය පාෂාණයක් වන්නේ,
(1) ෂේල් ය. (2) කිරි ගරුඬ ය. (3) වැලි ගල් ය. (4) ග්‍රැනයිට් ය.

**6.** රෝල් ක්‍රමයෙන් පසේ වයනය නිර්ණය කිරීමේ දී, තෙත් කළ පස් රෝල මුදුවක් ලෙස සැකසිය හැකි නම් එම පස,
(1) මැටි පසකි.
(2) වැලි ලෝම පසකි.
(3) මැටි ලෝම පසකි.
(4) වැලි පසකි.

**7.** බෝග වගාවට වඩාත් සුදුසු පාංශු ව්‍යූහ ආකාරය කුමක් ද?
(1) තනි කණිකා
(2) ස්ථම්භික
(3) අනු කෝණාකාර කුට්ටි
(4) කැටිති

**8.** පාංශු ක්ෂාරීයතාව ඇති වීමට හේතුවක් වන්නේ,
(1) වාරි ජලය මගින් පසට සෝඩියම් අයන එකතු වීම ය.
(2) අධික වර්ෂාපතනය නිසා භාස්මික අයන සේදී යාම ය.
(3) පසේ කාබනික ද්‍රව්‍ය වියෝජනය වීම ය.
(4) නිතර නිතර පස පෙරළීම ය.

[දෙවැනි පිටුව බලන්න.


**9.** පහත සඳහන් ශාක කුලවලට අයත් බෝග නිවැරදි ව දක්වා ඇති පිළිතුර කුමක් ද?

| | කුලය | බෝග වර්ග |
|---|---|---|
| A | පොඒසියේ | වී, ඉඳල් ඉරිඟු, කව්පි |
| B | කුකර්බිටේසියේ | කරවිල, වැටකොළු, බණ්ඩක්කා |
| C | සොලනේසියේ | මිරිස්, වම්බටු, තක්කාලි |
| D | ෆැබේසියේ | බඩ ඉරිඟු, සෝයා බෝංචි, මුං |

(1) A (2) B (3) C (4) D

**10.** තැටි නගුල, හැඩ ලැලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල යන කෘෂි උපකරණ,
(1) ප්‍රාථමික බිම් සැකසීමට යොදා ගන්නා අතර යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරවයි.
(2) ද්විතීයික බිම් සැකසීමට යොදා ගන්නා අතර සත්ත්ව බලයෙන් ක්‍රියා කරවයි.
(3) අතුරුයත් ගෑම සඳහා යොදා ගන්නා අතර මිනිස් බලයෙන් ක්‍රියා කරවයි.
(4) ප්‍රාථමික බිම් සැකසීම සඳහා යොදා ගන්නා අතර සත්ත්ව බලයෙන් ක්‍රියා කරවයි.

**11.** පහත රූපසටහනේ දැක්වෙන්නේ තවාන් පාත්ති දෙකක හරස්කඩ පෙනුමයි.




මෙහි A, B, C හා D සඳහා නිර්දේශිත අගය සෙන්ටිමීටරවලින් නිවැරදි ව පෙන්වන වරණය වන්නේ,

| | A | B | C | D |
|---|---|---|---|---|
| (1) | 100 | 15 | 20 | 10 |
| (2) | 75 | 10 | 30 | 20 |
| (3) | 80 | 15 | 25 | 20 |
| (4) | 100 | 05 | 30 | 10 |

**12.** තවාන්වලට නිතර වැළඳෙන 'දියමලන් කෑම' රෝගයේ රෝග කාරකය,
(1) බැක්ටීරියාවකි. (2) දිලීරයකි. (3) වෛරසයකි. (4) වට පණුවෙකි.

**13.** වම්බටු පත්‍ර දැලක් ආකාරයට ඉතිරි වන සේ පත්‍ර කා දමන කෘමියා වනුයේ,
(1) දුඹුරු පැළ කීඩෑවා ය. (2) අවුලකපෝරා ය. (3) එපිලැක්නා ය. (4) ඉල් මැස්සා ය.

**14.** දුර්වල ජලවහනය නිසා
(1) සවායු ක්ෂුද්‍රජීවී ගහනය වැඩි වේ.
(2) පස බුරුල් වීමෙන් කෘෂි උපකරණ භාවිතය පහසු වේ.
(3) වාතය ලබා ගැනීම සඳහා ශාක මුල් පසේ ගැඹුරට ගමන් කරයි.
(4) ශාක මුල් ආශ්‍රිත දිලීර රෝග සෑදීම වැඩි වේ.

**15.** ඉසින ජලසම්පාදනය,
(1) භූමියේ පාංශු ඛාදනය වැඩි කරයි.
(2) බෑවුම් සහිත ඉඩම්වලට සුදුසු නො වේ.
(3) බෝගවල පරාගණයට උපකාරී වේ.
(4) උසින් අඩු බෝග සඳහා වඩාත් සුදුසු ය.

**16.** පහත දැක්වෙන වගුවේ ශාක පෝෂක පිළිබඳ තොරතුරු නිවැරදි ව සඳහන් වන්නේ කුමන වරණයේ ද?

| | මූලද්‍රව්‍යය | ඉටු වන කාර්යය | ඌනතා ලක්ෂණ |
|---|---|---|---|
| (1) | N | පුෂ්පීකරණය | පත්‍ර දාර කහපාට වේ. |
| (2) | P | මූල පද්ධතියේ වර්ධනය | පත්‍ර පහසුවෙන් හැලේ. |
| (3) | K | හරිතප්‍රද නිපදවීම | මේරූ පත්‍ර කහ පාට වේ. |
| (4) | Ca | ඵල හටගැනීම | පත්‍ර දාර පිළිස්සුන ස්වභාවයක් ගනියි. |

**17.** පසට පොහොර යෙදීමේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ශාකයේ මුල ස්පර්ශ වන සේ පොහොර යෙදීම ය.
(2) පස යන්තමින් තෙත් ව පවතින විට පොහොර යෙදීම ය.
(3) ඩොලමයිට් සමඟ මිශ්‍රකර පොහොර යෙදීම ය.
(4) නිර්දේශිත ප්‍රමාණයට වඩා වැඩිපුර පොහොර යෙදීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

**18.** පහත සඳහන් වල් පැළෑටි අතරින් වාර්ෂික වල් පැළෑටියක් වන්නේ,
(1) කලාඳුරු ය. (2) ගඳපාන ය. (3) ඇත්තඩි ය. (4) මොනරකුඩුම්බිය ය.

**19.** සොලනේසියේ කුලයේ බෝගවලට බහුල ව වැළඳෙන බැක්ටීරියා රෝගයකි,
(1) පත්‍ර විචිත්‍රය. (2) දියමලන් කෑම. (3) හිටු මැරීම. (4) ඇන්ත්‍රැක්නෝස්.

**20.** වී ප්‍රභේදයක වයස තීරණය වන්නේ ගොයම් පැළෑටියේ කුමන අවධිය පදනම් කරගෙන ද?
(1) වර්ධක අවධිය (2) ප්‍රජනක අවධිය (3) මේරීමේ අවධිය (4) අස්වනු නෙළන අවධිය


**21.** දඬු කැබලි මුල් ඇදීම උත්තේජනය කිරීම සඳහා යොදා ගන්නා සරල සූර්ය ප්‍රචාරකය සම්බන්ධයෙන් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සූර්ය ප්‍රචාරකය තුළ ඉහළ උෂ්ණත්වයක් හා අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවක් පවතියි.
B - රෝපණ මාධ්‍ය ලෙස වැලි, කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1:1 අනුපාතයට යොදා ගැනේ.
C - ප්‍රචාරකය තුළ ජලවහනය දියුණු කළ යුතු වේ.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) B සහ C පමණි.

**22.** යම් භූමියක එක ම කාලසීමාවක දී බෝග වර්ග දෙකක් හෝ වැඩි ගණනක් නිසි පරතරයක් නොමැති ව වගා කිරීම,
(1) අතුරු බෝග වගාවයි. (2) ශෂ්‍ය බෝග මාරුවයි.
(3) මිශ්‍ර බෝග වගාවයි. (4) කඩින් කඩ වගාවයි.

**23.** ලෙමන් ශාකයක වායව අතු බැඳීම මගින් අත්තක මුල් අද්දවා ගැනීමට අපේක්ෂා කළ ශිෂ්‍යයෙකු විසින් එම අත්තේ සෙ.මී. 2ක පමණ පොතු වළල්ලක් ඉවත් කර එම ස්ථානයට මුල් අද්දවන මාධ්‍ය තබා ජලය දමා පොලිතීන් කොළයක් ඔතා බඳින ලදී. මෙහි දී පොතු වළල්ල ඉවත් කරන ලද්දේ,
(1) එම ස්ථානයෙන් ජලය වැඩිපුර ඉවත් වන නිසා ශාකය වැඩියෙන් ජල අවශෝෂණයට පෙළඹවීමට ය.
(2) එම අත්තේ නිපදවූ ආහාර ශාකයේ වෙනත් කොටස් කරා ගෙනයාම අවහිර කිරීමට ය.
(3) පොත්ත තුළින් එම අත්තේ ඉහළ කොටස්වලට ජලය ගමන් කිරීම බාධා කිරීමට ය.
(4) මුල් අද්දවාගත් පසු එම අත්ත මව් ශාකයෙන් වෙන්කර ගැනීම පහසු කර ගැනීමට ය.

**24.** නිර්පාංශු වගාවේ දී පෝෂණ මාධ්‍යයක් ලෙස යොදා ගත හැකි ද්‍රව්‍යයක් වන්නේ,
(1) කොහු බත් ය. (2) පිළිස්සූ දහයියා ය. (3) ඇල්බට් ද්‍රාවණය ය. (4) වැලි ය.

**25.** පහත A, B, C සහ D රූප සටහන්වලින් දැක්වෙන්නේ සිටුවීම සඳහා සූදානම් කළ දඬු කැබලි 4කි.



A B C D

මෙයින් සිටුවීමට වඩාත් ම සුදුසු දඬු කැබැල්ල වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** පටක රෝපණය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) පටක රෝපණය මගින් රෝගී මව් ශාකයකින් වුව ද නිරෝගී පැළ ලබා ගත හැකි ය.
(2) අනෙකුත් ප්‍රචාරණ ක්‍රමවලට වඩා වැඩි පැළ සංඛ්‍යාවක් පටක රෝපණයෙන් නිපදවා ගත හැකි ය.
(3) පටක රෝපිත පැළ කටුක පරිසරවලට ඔරොත්තු දෙයි.
(4) පටක රෝපිත පැළ ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම පහසු ය.

**27.** මේරීමේ අවධිය අනුව සිටුවීමට ගන්නා දඬු කැබලි වර්ග කරනු ලැබේ. සිටුවීමට ගන්නා ළා දඬු කැබලි වර්ග නම්,
(1) බතල, කෝලියාස් හා ඉන්නල ය. (2) රෝස, ක්‍රෝටන් හා බෝගන්විලා ය.
(3) ඉන්නල, මඤ්ඤොක්කා හා කෝලියාස් ය. (4) රෝස, තේ හා බතල ය.

**28.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අර්තාපල් ආකන්ද සූර්යාලෝකයට නිරාවරණය වුව හොත් කොළපාට වන අතර ඒවා ආහාරයට සුදුසු නැත.
(2) කර්තකොළොම්බන් අඹ ප්‍රභේදය තෙත් කලාපයේ වගා කළ විට නියමිත ගුණාත්මයෙන් යුතු අඹ අස්වැන්නක් ලැබේ.
(3) අඹ, කෙසෙල්, පැපොල් වැනි පලතුරුවල අස්වනු නෙළීම, ඒවා පරිණත අවස්ථාවට පැමිණීමට පෙර කළ යුතු ය.
(4) විලාඩ් අඹවල ආවේණික පැහැය ඇති වීමට අඩු ආලෝකය වැදගත් වේ.

43254

29. ජලයේ අද්‍රාව්‍ය විටමින් පමණක් ඇති වරණය තෝරන්න.
(1) A හා B (2) B හා K (3) D හා C (4) A හා D

30. ආහාර නරක් වීම කෙරෙහි බලපාන භෞතික සාධකයකි,
(1) එන්සයිමීය ක්‍රියා. (2) ඔක්සිකරණය. (3) ආලෝකය. (4) කෘෂි රසායන ද්‍රව්‍ය.

31. උෂ්ණත්ව පාලනය මගින් ආහාර පරිරක්ෂණය සිදුකරන ක්‍රමයක් වනුයේ,
(1) සාන්ද්‍රීකරණය යි. (2) පැස්චරීකරණය යි. (3) දුම් ගැසීම යි. (4) පැසවීම යි.

32. උඩරට ගොවිපොළවල සාර්ථක ව ඇති කරන, උසස් කිරි නිෂ්පාදනයක් ලබාදෙන, කළු හා සුදු පුල්ලි සහිත විශාල දේහයක් සහ විශාල බුරුල්ලක් ඇති ගව වර්ගයකි,
(1) ජර්සි. (2) ෆ්‍රීෂියන්. (3) මූරා. (4) නිලිරවි.

33. කිරි දෙනුන්ගේ ගර්භණී අවධියේ අවසාන මාස දෙක තුළ කිරි දොවනු නොලැබේ. මෙම කාලය හඳුන්වන්නේ,
(1) මද කාලය වශයෙනි. (2) ගැබ් කාලය වශයෙනි.
(3) ප්‍රසූත කාලය වශයෙනි. (4) වියළි කාලය වශයෙනි.

34. කුකුළු ගොවිපොළක, පැටවුන් ආහාර නොගැනීම, ලේ මිශ්‍ර පාචනය, මලානික හා උදාසීන බව, සතුන් විශාල ප්‍රමාණයක් මිය යාම වැනි ලක්ෂණ දක්නට ලැබුණි. මෙම සතුනට වැළඳී ඇතැයි සැලකිය හැකි රෝගය නම්,
(1) පුල්ලෝරම් ය. (2) රැනිකට් ය.
(3) කොක්සිඩියෝසිස් ය. (4) කුකුළු වසූරිය ය.

35. ගවයින්ගේ කිරි උණ රෝගය ඇති වීමට හේතුව කුමක් ද?
(1) රනිල ශාක වැඩිපුර ආහාරයට ගැනීම
(2) ආහාර ජීරණ පද්ධතිය ආශ්‍රිත ව පණුවන් විසින් රුධිරය උරා බීම
(3) කිරි සමග ශරීරයෙන් කැල්සියම් ඉවත් වීම
(4) ගව ගාලේ හා ගව දෙනගේ අපිරිසිදුකම

36. ගව පැටවුන් පෝෂණය කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - පැටවා ඉපදී මුල් දින තුන තුළ පැටවුන්ට ප්‍රමාණවත් පරිදි මුල් කිරි ලබා දිය යුතු ය.
B - කිරි වරන තුරු පැටවුන් සමූහ කොටුවල ඇති කළ යුතු ය.
C - කිරි වරන විට පැටවාගේ බර උපත් බර මෙන් දෙගුණයක් විය යුතු ය.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි.
(3) A සහ C පමණි. (4) A, B හා C යන සියල්ලම ය.

37. ශිෂ්‍යයෙකු විසින් දිනක් වයසැති කුකුළු පැටවුන් 12ක් මිල දී ගෙන කිකිළියක මගින් රැකබලා ගැනීමට සලස්වන ලදී. මෙහි දී කිකිළියගෙන් බලාපොරොත්තු වන ප්‍රධාන කාර්යය නම්,
(1) කුකුළු පැටවුන් ස්වාධීන ව ජීවත් වීමට හුරු කිරීම ය.
(2) පැටවුන්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම ය.
(3) පැටවුන්ට අවශ්‍ය උණුසුම ලබා දීම ය.
(4) පැටවුන්ට අවශ්‍ය මව් සෙනෙහස ලබා දීම ය.

38. විවිධ හේතු නිසා බීජ සුප්තතාව ඇති වේ. පැපොල්, තක්කාලි හා වැල්දොඩම් යන බීජවල සුප්තතාවට හේතු වන්නේ,
(1) නොමේරූ කලල පැවතීමයි.
(2) බීජාවරණය ඝනව පැවතීමයි.
(3) බීජාවරණය, වාතයට හා ජලයට අපාරගම්‍ය වීමයි.
(4) බීජාවරණයේ වර්ධක නිශේධක ද්‍රව්‍ය පැවතීමයි.

39. කිරි මිදවීම සඳහා මැටි බඳුන් භාවිතය මගින්,
(1) බඳුන්වල සවිවර පෘෂ්ඨය නිසා ජලය වාෂ්ප ලෙස ඉවත් වීමෙන් ජල ප්‍රතිශතය අඩු වේ.
(2) මැටිවල ඇති ඛනිජ එකතු වී කිරිවල පෝෂණය වැඩි කරයි.
(3) ජලය, වාතය හා ක්ෂුද්‍රජීවීන් ඇතුළු වීම වැළකී ආහාරය සුරකෙයි.
(4) ආලෝකය ඇතුළු වීම වළක්වන නිසා කිරිවල ජීව කාලය වැඩි කරයි.

40. ආහාර නිෂ්පාදනයකට ලබාදෙන SLS සහතිකය මගින් තහවුරු කරන්නේ,
(1) එහි ස්වභාවය නොවෙනස් ව දිගු කාලයක් පවත්වාගත හැකි බවයි.
(2) එය අපනයනය කිරීමට සුදුසු තත්ත්වයක ඇති බවයි.
(3) එය කාබනික ගොවිතැනින් ලබාගත් නිෂ්පාදනයක් බවයි.
(4) එය සෞඛ්‍යාරක්ෂිත බවකින් සහ ගුණාත්මක ප්‍රමිතියකින් යුක්ත බවයි.

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024 (2025)

කෘෂි හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂි හා ආහාර තාක්ෂණය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ හෙක්ටාර 2ක පොල් ඉඩමක් සහ යාබද ව පිහිටි කුඩා කුඹුරක් ද ඇති ගොවි මහතෙක් තම පවුලේ පරිභෝජනයට ගන්නා ආහාර වැඩි ප්‍රමාණයක් තම ගෙවත්තේ ම නිපදවා ගැනීමට අදහස් කළේ ය.

(i) මෙම ඉඩමේ පස සේදී යාම නිසා ආම්ලික වී ඇති බැවින් එය බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කිරීමට යෙදිය යුතු ද්‍රව්‍යයක් නම් කරන්න.

(ii) එම ඉඩමේ පස සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iii) පොල් වගාවේ අතුරු බෝග ලෙස වගා කළ හැකි පලතුරු බෝග **දෙකක්** නම් කරන්න.

(iv) ඉඩමේ ඇති පොල් වගාවට හානි කරන කෘමි පළිබෝධයෙකු නම් කරන්න.

(v) ඉඩමේ ජලවහනය දුර්වල කොටසේ වගා කළ හැකි පලා එළවළු වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(vi) එම කොටසේ ජලවහනය දියුණු කිරීමට යොදා ගත හැකි ජලවහන කානු පද්ධති (රටා) **දෙකක්** නම් කරන්න.

(vii) (a) කිරි ලබා ගැනීම සඳහා මෙම ඉඩමේ ඇති කිරීමට යෝග්‍ය ඉන්දීය ගව වර්ගයක් නම් කරන්න.
(b) තෘණ සංරක්ෂණය කර සාදා ගන්නා ගව ආහාර **දෙකක්** ලියන්න.

(viii) කිරිවදින වී බීජවල යුෂ උරාබොන කෘමි පළිබෝධයෙකු නම් කරන්න.

(ix) වී වගාවේ වල් පැළෑටි පාලනයට යොදා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(x) කාබනික පොහොර පසට යෙදීමෙන් ඇති වන වාසි **දෙකක්** සඳහන් කරන්න.

**2.** ප්‍රමාණවත් තරම් වර්ෂා ජලය නොලැබෙන විට බෝග වගාව සඳහා ජල සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ.

(i) (a) පසෙහි අඩංගු වන පාංශු ජල වර්ග **දෙකක්** ලියන්න.
(b) ක්ෂේත්‍ර ධාරිතාවේ පවතින පසක ඇති ජල වර්ග මොනවා ද?

(ii) බෝග වගාවකට යොදන ජලය එම පසෙන් ඉවත් වන ක්‍රම **හතරක්** ලියන්න.

(iii) වගා භූමියකට යොදන ජලය සංරක්ෂණය කර ගන්නා ක්‍රම **තුනක්** ලියන්න.


**3.** සමහර ශාක තම වර්ගයා බෝ කිරීම සඳහා වර්ධක ප්‍රචාරණ ව්‍යූහ නිපදවයි. ඒවා රෝපණ ද්‍රව්‍ය ලෙස යොදා ගනු ලැබේ.

(i) (a) ස්වභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යූහ **හතරක්** නම් කරන්න.
(b) දඬු කැබලි මුල් ඇද්දවීම උත්තේජනය කිරීම සඳහා යොදා ගන්නා වර්ධක හෝමෝන **දෙකක්** සඳහන් කරන්න.

(ii) වර්ධක ප්‍රචාරණයේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** වෙන වෙන ම සඳහන් කරන්න.

[හයවැනි පිටුව බලන්න.

(iii) පහත රූපයේ දක්වා ඇත්තේ දඬු කැබැල්ලක් මුල් අද්දවා ගැනීම පිණිස සකසනු ලබන ව්‍යුහයකි. මෙහි දී රෝපණ මාධ්‍යයට ජලය යොදා පොලිතීනයේ කට ගැට ගසා සංවෘත පරිසරයක් ඇති කරනු ලැබේ.




(a) මෙම ව්‍යුහය හඳුන්වන නම කුමක් ද?

(b) මෙම ව්‍යුහය සකසන අවස්ථාවේ දී සංවෘත පරිසරයක් ඇතිකිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

4. බෝග වගාවේ දී උසස් ගුණාත්මයෙන් යුතු, වැඩි අස්වැන්නක් ලබා ගැනීමට පළිබෝධ පාලනය වැදගත් වේ.

(i) (a) වී වගාවක පත්‍ර වියළී ශාක මිය ගොස් වෘත්තාකාර හැඩයක් ගත් හානි වූ ප්‍රදේශ දක්නට ලැබුණි. මෙම පළිබෝධ හානිය හඳුන්වන නම කුමක් ද?

(b) මෙම තත්ත්වය ඇති කරන පළිබෝධ කෘමියා නම් කරන්න.

(c) මෙය පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(ii) (a) බෝගවල පත්‍ර විචිත්‍ර රෝගයට හේතු වන රෝග කාරකය නම් කරන්න.

(b) පත්‍ර විචිත්‍ර රෝගය වැළඳෙන බෝග **දෙකක්** සඳහන් කරන්න.

(iii) (a) රූපාකාරය අනුව වල් පැළෑටි වර්ගීකරණය කර දක්වන්න.

(b) වල් පැළෑටි නිසා බෝගවලට සිදු වන හානි **තුනක්** ලියන්න.

5. නිතර නිතර බෝග වගා කිරීම නිසා එම පසේ පෝෂක ක්‍රමයෙන් අඩු වී යයි. මෙම භූමිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පොහොර යෙදිය යුතු ය.

(i) (a) ශාකයකට වාතයෙන් ලැබෙන පෝෂකයක් සහ ජලයෙන් ලැබෙන පෝෂකයක් වෙන වෙන ම ලියා දක්වන්න.

(b) පොස්පරස් පෝෂකය ලබාදෙන රසායනික පොහොර වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(ii) (a) බෝග වගාවේ දී නයිට්‍රජන්වලින් ඇති ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

(b) ශාකවල දක්නට ලැබෙන නයිට්‍රජන් ඌනතා ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(iii) කෘෂි රසායන භාවිතය නිසා පරිසරයට සිදු වන අයහපත් බලපෑම් **හතරක්** ලියන්න.

6. බෝග අස්වැන්න, නියමිත අවස්ථාවේ දී නෙළා ගත යුතු අතර අතිරික්ත අස්වැන්න පරිරක්ෂණය කිරීම ද වැදගත් වේ.

(i) පහත සඳහන් අවස්ථාවල දී එළවළු හා පලතුරුවල අස්වනු නෙළීම නිසා අස්වැන්නට ඇති වන බලපෑම සඳහන් කරන්න.

(a) නියමිත පරිණත අවධියට පෙර අස්වනු නෙළීම

(b) නියමිත පරිණත අවධියට පසු ව අස්වනු නෙළීම

(c) වර්ෂාව හෝ පිනි ඇති අවස්ථාවල අස්වනු නෙළීම

(ii) ආහාර පරිරක්ෂණයේ වැදගත්කම් **හතරක්** ලියන්න.

(iii) ආහාර කල් තබා ගැනීමට නිර්දේශිත පරිරක්ෂක ද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

7. වාණිජ මට්ටමින් සත්ත්ව පාලනය කිරීමේ දී, පාලන ක්‍රම හා සත්ත්ව ආහාර ද සත්ත්ව රෝග හා ඒවා මර්දනය ද වැදගත් වේ.

(i) (a) ශ්‍රී ලංකාවේ වාණිජ මට්ටමින් කුකුළන් ඇති කිරීම සඳහා බහුල ව භාවිත කරන ක්‍රමය නම් කරන්න.

(b) එම ක්‍රමයේ වාසි **හතරක්** ලියන්න.

(ii) (a) කුකුළන්ට වැළඳෙන වෛරස් රෝගයක් නම් කරන්න.

(b) එම රෝගයේ රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(c) එම රෝගය පාලනය කිරීමේ ක්‍රම **දෙකක්** ලියන්න.

(iii) ඉපදී මුල් දිනය තුළ ගව පැටවකුට සිදු කළ යුතු සත්කාර **හතරක්** ලියන්න.

* * *